**පස්සර ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පස්සර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් නොකළ කර්මාන්ත 03 කට ගෙවිය යුතු රු.1,177,675 ක් ණය හිමි ලෙසට මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබුණි. | 2024 ජනවාරි මුල් සතියේ වැඩ නිම කළ බැවින්, ණයහිමි ලේඛනයට ඇතුළත් කරන ලද බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.144,694 ක් වූ පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවා තිබුණු මන්ත්‍රී දීමනා සහ දුරකථන දීමනා රු.105,194 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණු මන්ත්‍රී දීමනා සඳහා වෙනම ගිණුමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවා තිබුණු දීමනා අයකරගත යුතුය. |

**1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ ලුණුගල ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු මෝටර් රථ සහ කරත්ත වටිනාකම රු.1,117,500 ක් සහ සේවක ණය රු.675,426 ක් සඳහා සනාථ කිරීමට අවශ්‍ය විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෝටර් රථ හා කරත්ත පවරා දීමටත්, සේවක ණය ශේෂය නිරවුල් කරදෙන ලෙසත් ලුණුගල ප්‍රාදේශීය සභාවට දන්වා ඇති බව. | විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2012 වර්ෂයේ සිට පැවත එන රු.75,712ක අගරු චෙක්පත් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණන හා කළමනාකරණ කමිටුවට යොමුකර උපදෙස් අනුව කටයුතු කරන බව. | චෙක්පත් නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,709,927 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,399,602 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

**අරමුදල් ඵලදායි ආයෝජනයට නොයෙදවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සිට සභාව නමින් රාජ්‍ය බැංකුවක පවත්වා තිබුණු ජංගම ගිණුමක පැවති රු.284,058 ක ශේෂය ඵලදායිව ආයෝජනය කර නොතිබුණි. | මුදල ස්ථාවර තැන්පතුවක් ලෙස තැන්පත් කර මූල්‍යමය ප්‍රතිලාභයක් ලබාගැනීමට තීරණය කර ඇති බව. | මුදල් ඵලදායීව ආයෝජනය කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 7,856,159 | 6,738,358 | 4,886,434 | 1,851,924 | 7,181,159 | 6,271,199 | 3,599,138 | 2,672,061 |
| (ii) | කුලී | 20,905,122 | 20,461,415 | 15,949,298 | 4,512,117 | 20,873,872 | 20,481,563 | 15,709,218 | 4,772,345 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 990,000 | 356,618 | 356,618 | 0 | 826,000 | 743,423 | 743,423 | 0 |
| (iv) | වෙනත ආදායම් | 2,733,500 | 2,617,116 | 2,617,116 | 0 | 14,569,500 | 21,629,273 | 12,220,263 | 9,409,010 |
| | එකතුව | **32,484,781** | **30,173,507** | **23,809,466** | **6,364,041** | **43,450,531** | **49,125,458** | **32,272,042** | **16,853,416** |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 02කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි වරිපනම් බදු රු.117,493 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට සැලසුම් සකස් කර ඇති බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | වසර 02කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි ජල ගාස්තු රු. 623,571 ක් අයකරගෙන නොතිබුණි. | රු.357,827 ක හිඟහිටි ජල ගාස්තු අය කර ගෙන ඇති අතර, විසන්ධි කරනලද ජල ගාස්තු කපා හැරීමට අනුමැතියට යොමුකර ඇති බව. | -එම- |
| (ඇ) | වසර 02කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි ටෙන්ඩර් කඩ කුලී රු.6,813,253 ක් අයකරගෙන නොතිබුණි. | කඩ කුලී කපා හැරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.8,666,459 ක් හා මුද්දර ගාස්තු රු.8,322,955ක් ගෙන්වාගෙන නොතිබුණි. | උසාවි දඩ රු.3,006,313 ක් සහ මුද්දර ගාස්තු රු.1,409,895 ක් අයකරගෙන ඇති බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැඟිලි ලේඛනයට අනුව සහ රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 1948 ජනවාරි 30 දිනැති සිතියම්ගත පිඹුරේ Tenement List අනුව පර්චස් 30.54 ක ඉඩම සභාවට අයිතිවී තිබුණි. මෙම ඉඩම ඵලදායී කාර්යයකට යොදා නොගැනීම හේතුවෙන් බාහිර පාර්ශවයන් විසින් අයිතිය ලබා ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණි. ඒ හේතුවෙන් අධිකරණ කටයුතු සඳහා රු.168,000 ක වියදමක් දැරීමට සිදුව තිබුණි. | නඩු වාර 04 ක් සඳහා එම මුදල ගෙවා ඇති බව. | සභාවට අයත් දේපළ හඳුනාගෙන නිරවුල් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ භූමි යෝග්‍යතා සහතිකයේ විශේෂ කොන්දේසි අංක 04 අනුව ගොඩනැඟිලි ඉදිකිරීම් කරන්නේ නම්, ඊට අදාළ සැලසුම් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය (NBRO) වෙත ඉදිරිපත් කර සැලසුම්වලට අදාළ නිර්දේශ ලබාගත යුතු බවට දක්වා තිබුණි. නමුත් කළමනාකාරිත්වය විසින් එම උපදෙස් කෙරෙහි අවධානය යොමු නොකර ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) ප්‍රතිපාදන මත 2023 වර්ෂයේ රු.26,079,033 ක් වැය කර නව වෙළඳ සංකීර්ණ ගොඩනැඟිල්ල ඉදිකර තිබුණි. 2024 මාර්තු මාසය වන විට නාය යාම හේතුවෙන් ගොඩනැඟිල්ල පිහිටි භූමියේ විශාල පිපිරීම්, ඇතුළත බිත්ති හා ටයිල් පුපුරායාම සහ එහි වීදුරු දොරක් සම්පූර්ණයෙන්ම බිඳී තිබීම නිරීක්ෂණය විය. | අධික වර්ෂාව හා භූමියේ ගැඹුරු ලෙස පහළට තල්ලුවී යාමේ සිද්ධියක් නිසා සිදුව ඇති බව. | ඉදිකිරීම් සිදුකිරීමට පෙර භූමියේ යෝග්‍යතාවය කෙරෙහි අවධානය යොමුකර අදාළ ආයතන වල නිර්දේශ මත ඉදිකිරීම් කළ යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371 (2) (ආ) අනුව තත්කාර්ය අතුරු අග්‍රිමයක් කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවද, 2006 සහ 2014 වර්ෂ වලදී අවස්ථා 03ක දී ලබාදී තිබුණු රු.88,496 ක අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ කමිටුව වෙත යොමු කර අදාළ උපදෙස් පරිදි කටයුතු කරන බව. | අදාළ කාර්ය නිම වූ වහාම අත්තිකාරම් නිරවුල් කර ගත යුතුය. |
| (ඈ) | 2006 වර්ෂයේ සිට පැවත එන රු.659,087 ක ප්‍රතිපූර්ණය කළ යුතු වැටුප් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | -එම- | සුදුසු ක්‍රියාමාර්ග ගෙන නිරවුල් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන සහ පස්සර ප්‍රාදේශීය සභාව පොදු වෙළඳපොළ කඩහිමියන්ගෙන් රැස් කරගෙන තිබුණු රු.44,770,559 ක මුදල් යොදවා 2017 වර්ෂයේ කඩ කාමර 46කින් යුතු පොදු වෙළඳපොළ සංකීර්ණයක් ඉදිකර තිබුණි. 2018 වර්ෂයේදී කඩ කාමර බදු දීමේදී පැරණි කඩහිමියන්ට ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව වසර 30 ක දිගුකාලීන බදු පදනම මත කඩ කාමර 20 ක්, ටෙන්ඩර් ක්‍රමයෙන් දීර්ඝකාලීන බදු පදනම මත කඩ කාමර 21 ක් සහ වාර්ෂික ටෙන්ඩර් මත කඩ කාමර 05 ක් බදුදීමට සභාව තීරණය කර තිබුණි. මෙම කඩ කාමර 42 න් 2023 ඔක්තෝබර් 31 දිනට රු.12,165,159 ක කඩ කාමර කුලී හිඟ හිටව පැවතුණි. | ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව. | ගිවිසුම් අනුව කටයුතු කර හිඟ ආදායම් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉහත 3.2 (අ) ඡේදයේ සඳහන් කඩ කාමර සෑදීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු ණය මුදලට අදාළ මාසික ණය වාරිකය හා පොලිය රු.507,445 ක් වුවත්, එම මුදල ගෙවීමට හෝ පොදු වෙළඳපළ සංකීර්ණයේ කඩ කාමර වලින් ප්‍රමාණවත් ආදායමක් නොලැබුණි. | පැරණි කඩ හිමියන් සභාවට එරෙහිව අධිකරණයේ නඩු පවරා ඇති බව. | අධිකරණ තීරණ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සේවයේ නියුක්තව සිටින සේවකයින් 29 ක්, විශ්‍රාම ගිය සේවකයින් 04ක් සහ සේවය අතහැර ගිය සේවකයින් 03 කට අදාළ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සේවා නියුක්ත භාර අරමුදලට දායක මුදල් ලෙස රු.468,978 ක් ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් අධිභාර වශයෙන් රු.374,909 ක් ගෙවීමට සිදුවී තිබුණි. | 2016 වර්ෂයේ සිට ගෙවීමට තිබුණු මුදලින් මේවනවිට 300,000 ක් ගෙවා ඇති අතර, ඉතිරිය මාසිකව වාරික වශයෙන් ගෙවීමට කටයුතු කර ඇති බව. | නියමිත කාලය තුළ සේවා නියුක්ති භාර අරමුදලට දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු නොකිරීමට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අයකරගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමාණවත් ආදායම් මාර්ග නොමැතිව හා නව ආදායම් මාර්ග හඳුනා ගැනීමකින් තොරව සහ විධිමත් බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව 2020 වර්ෂයේදී තාවකාලික ක්ෂේත්‍ර කම්කරුවන් 29 ක් බඳවාගෙන අදාළ රාජකාරී පැවරීමක් සිදු කර නොතිබුණි. මෙම සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සභා අරමුදලින් රු.2,003,750 ක වැටුප් ගෙවා තිබුණි. | මහජන සේවාවල විවිධ අංශ එකතුවීම නිසා එකී සේවාවන් ඉටුකිරීමට අතිරේක සේවකයින් යෙදවීමට සිදුව ඇති බව. | කාලීනව කාර්ය මණ්ඩලය අනුමත කර බඳවා ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති (LDSP) අරමුදල් යටතේ 2021 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු. 113,700 ක් වූ විෂබීජ නාශක දියර ඉසින යන්ත්‍ර 06 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් නිෂ්කාර්යව පැවතුනි. | කොවිඩ් වසංගත උවදුර ක්‍රමයෙන් අඩුවීම මත විෂබීජ නාශක දියර ඉසීම අවම වූ බව සහ ඉදිරි කාලයේදී මෙම යන්ත්‍ර වලින් ප්‍රයෝජන ගැනීමේ හැකියාව පවතින බව. | මෙම යන්ත්‍ර ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |